www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
# රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021
## පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

## *Sinhala Language & Literature – I*
## සිංහල භාෂාව හා සාහිත්‍යය – I

| 21 | S | I |
|---|---|---|

Name :- .................................................... Grade : -................ Index number:-....................

❖ අංක 1 සිට 4 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත වචනවල අර්ථයට සමීප අර්ථය ඇති වරණය තෝරන්න.

1. කොවිඩ් වසංගත සමයෙහි ඇතැම් වෙළෙඳුන්ගේ ස්වභාවය වන්නේ **කල දුටු කළ වළ ඉහ ගැනීම**යි.
   (1) සුදුසු කාලයේ දී වළ ඉස ගැනීම.
   (2) තමන්ගේ පමණක් බඩවියත රැක ගැනීම.
   (3) අවස්ථානුකූලව සියලු ලාභ ප්‍රයෝජන තමන් සතු කර ගැනීම.
   (4) අනුන් තළාපෙළා වැඩ ගැනීම.

2. පන්තියේ සිටි ළමයින්ගේ **තොරතෝංචියක්** නැති කතාව අනික් ළමුන් තුළ කනස්සල්ලක් ඇති කළේ ය.
   (1) චාතුර්යයක් (2) නැවතීමක් (3) ශිෂ්ටත්වයක් (4) ප්‍රමාදයක්

3. පුතුගේ විභාග සාමාර්ථ්‍යය ගැන ඇසූ පියා එකවරම පැවසුවේ තම **හිසේ මලක් පිපුණාක් මෙන්** හැඟුණු බවයි.
   (1) අවේගශීලී වීම. (2) මන්දෝත්සාහී වීම.
   (3) බෙහෙවින් සතුටට පත් වීම. (4) කම්මැලි වීම.

4. **ගොම්මන් වෙලාවට** ගමන් බිමන් යෑම අයෝග්‍ය බව අම්මා අක්කාට කීවා ය.
   (1) මධ්‍යාහ්න කාලයේ (2) සන්ධ්‍යා කාලයේ
   (3) රාත්‍රියේ (4) හිමිදිරියේ

❖ අංක 5 සිට 8 තෙක් දී ඇති ප්‍රශ්නවල හිස්තැන්වලට වඩාත් සුදුසු පදය තෝරන්න.

5. මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ පබාවති නාට්‍යය නැරඹූ .............................. පත් වූ හ.
   (1) ප්‍රේක්ෂකයෝ (2) විදග්ධයෝ
   (3) ශ්‍රාවකයෝ (4) පාඨකයෝ

6. මහෞෂධ පඬිතුමා තම රාජ්‍යය ආක්‍රමණිකයන්ගෙන් මුදා ගැනීමට යෙදූ උපාය මාර්ගවලින් හෙළි වන්නේ එතුමාගේ .............................. ධෛර්යයි.
   (1) අප්‍රතිහත (2) අනන්ත
   (3) උපකාරී (4) දක්ෂ



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

7. 'මරරඳ' යන්නට යෙදෙන සමානාර්ථ පදයක් වන්නේ ............................... ය.

(1) නිසයුරු (2) සරණාවී (3) මීන්දද (4) පුරඳර

8. ගොවිතැන හා ............................... බැඳුණු ගවයාට සත්කාර කිරීම හින්දූන්ගේ කෘතගුණ දැක්වීම යි.

(1) අත්‍යන්තයෙන් (2) එකට

(3) හර්ෂෝන්මදයෙන් (4) නිසර්ගයෙන්

9. අකාරාදී පිළිවෙළට වචන යෙදී ඇති වරණය තෝරන්න.

(1) කැන්ගරුවා, කැස්වටුවා, කැහිපිල්ලා, කැරපොත්තා

(2) උපකාර, උවැසි, උලැඟි, උදහස්

(3) ඔල්මාදය, ඔලගු, ඔරලෝසු, ඔමරි

(4) ඉඟුරු, ඉපනැල්ල, ඉර සේවය, ඉසුරු

10. අක්ෂර වින්‍යාසය නිවැරදිව යෙදී ඇති වාක්‍ය තෝරන්න.

(1) කෘෂිකාර්මික නොවන ජීවන වෘර්තීන්හි නිරත වූ ජනකොටස් ද සමාජයක වෙසෙති.

(2) සමථ මණ්ඩල සභාපතිවරයා සමස්ත ජනතාව කෙරෙහි දයාර්ද්‍ර සිතින් කටයුතු කළ යුතු ය.

(3) දෙවන ලෝක යුද්ධය අවදියේ දී අගනුවර විද්‍යාලවල කටයුතු සීමා විය.

(4) ඇයි අපේ බයිබලෙත් තියෙනවා ආපධා ගැන.

11. සිංහලයේ අර්ධ ස්වරයක් ලෙස සැලකෙන්නේ,

(1) ව (2) ඟ (3) ඕ (4) අ

12. රකාරාංශය, ඇදය, ගයනුකිත්ත, දීර්ඝ පාපිල්ල පිළිවෙළින් යෙදුණු පද පේළිය තෝරන්න.

(1) පෞරාණික, ස්තූපය, දූහැමි, වස්ත්‍රාභරණ (2) අභූත, කැටයම්, ක්‍රමිකව, අගෞරව

(3) ප්‍රභාෂ්වර, පැහැදිලි, භෞමික, කුඹියා (4) ප්‍රදර්ශන, රැහැන, භූමිකාව, ඖදර්යය

13. විරුද්ධාර්ථවත් පද යුගලයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

(1) ආගමන - විගමන (2) ප්‍රබුද්ධ - සුප්‍රබුද්ධ

(3) උක්ත - අනුක්ක (4) ඉහළ - පහළ

14. එක් එක් පද පේළියේ දී ඇති පදවලට සමානාර්ථ යෙදුම් පමණක් ඇතුළත් නොවන පද පේළිය තෝරන්න.

(1) චන්ද්‍රයා - තරිඳු, මුහුද - දලනිඳු, සතුට - සතොස, ශක්‍රයා - සුරසඳ

(2) කුරුලු - සකුණ, ගින්න - අනල, මව - දිනිති, රජ - භූපති

(3) වසර - අවුරුද්ද, නෙළුම් - කමල, හිරු - තාරපති, රත්තරන් - කසුන්

(4) අහස - ගගන, නිවස - මැදුර, අනංගයා - මීන්දද, මීමැසි - බිඟු

15. මුලින් දී ඇති බහුඅර්ථ පදයට නිවැරදි අර්ථය නොදෙන පදයක් ඇති වරණය තෝරන්න.

(1) සඳ - චන්ද්‍රයා, කල්හි, උතුම්, සන්ධි

(2) කර - බෙල්ල, රශ්මිය, දැලිපිහිය, අත

(3) දිය - ලෝකය, ජලය, දෙන්න, ජයග්‍රහණය

(4) ගුරු - ඇදුරු, බ්‍රහස්පති, දුඹුරු, උතුම්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

16. වැරදි අදහස දෙන ප්‍රකාශය තෝරන්න.
    (1) ''ඔහු'' යන්න උක්ත පදයක් මෙන් ම අනුක්ත පදයක් ද වේ.
    (2) සිංහල භාෂාවේ සන්ධි වර්ග 10 කි.
    (3) සමාස නොවන විභක්ති වන්නේ කර්ම සහ කර්තෘ විභක්තිය යි.
    (4) ඍ, ඎ අක්ෂර දෙක භාවිතයේ නැත.

17. බල්ලන් <u>බුරද්දී</u> සොරු බිම <u>වැටී</u> <u>දිව්වෝ ය.</u>
    ඉහත දැක්වෙන වාක්‍යයේ ඇති ක්‍රියාපද පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.
    (1) අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, අවසාන ක්‍රියා
    (2) අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා
    (3) මිශ්‍ර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අවසාන ක්‍රියා
    (4) පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා

18. පහත සඳහන් (අ) (ආ) කොටස් යෝග්‍ය පරිදි ගැළපී ඇති වර්ණය තෝරන්න.

| (අ) | (ආ) |
|---|---|
| A - ප්‍රථමා විභක්තිය | E - වලසුන්ගෙන් |
| B - කර්ම විභක්තිය | F - වලසුන්ට |
| C - අවධි විභක්තිය | G - වලස්සු |
| D - සම්ප්‍රදාන විභක්තිය | H - වලසුන් |

    (1) AG, BH, CE, DF    (2) AF, BE, CG, DH
    (3) AE, BF, CH, DG    (4) AH, BG, CF, DG

❖ අංක 19 සහ 20 යටතේ දී ඇති අදහසට වඩාත් ගැළපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

19. නිෂ්ඵල ක්‍රියාවක නිරත වීම.
    (1) කළුවා මාරපන ගියා වගේ    (2) හිල් කුඩෙන් වතුර අදිනවා වගේ
    (3) අඬන්න ඕනැලු කිරි එරෙන්න    (4) පරංගියා කෝට්ටේ ගියා වගේ

20. ''බල්ලන්ට ලෙලි පොල් දෙන්නා වගේ'' යන ප්‍රස්තාව පිරුළේ අදහස වඩාත් යෝග්‍ය ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.
    (1) අවුල් සහගත ක්‍රියාවක් සිදු කිරීම.    (2) කුමකින් හෝ කාර්යය සිදු කිරීම.
    (3) නිෂ්ඵල යමක් සිදු කිරීම.    (4) පහත් ගති ඇත්තා කිසි දෙයක් සිදු නොකිරීම.

21. මුලින් දී ඇති සන්ධි පද නිවැරදි ව විසන්ධි කර ඇති වරණය තෝරන්න.
    (1) පන්සාලිස් , පරමේශ්වර - පස් + සාලිස් , පරම + ඊශ්වර
    (2) දිනිසුරු , දැත - දින + ඉසුරු , දෙ + අත
    (3) ළිංපඩිය , කවියා - ළිඳේ + පඩිය , කවි + ආ
    (4) උපනුපන් , නිලුපුල් - උපන් + නුපන් , නිල් + උපුලි





agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

22. ''නොදනිත් දරුවන් **ඇකයෙන්** වැටුණා'' යන්නෙහි තද කළු අකුරෙන් යුත් පදයේ විභක්ති අර්ථය වන්නේ,

(1) සම්බන්ධ (2) ආධාර (3) අවධි (4) කරණ

❖ පහත සඳහන් ප්‍රශ්නවල වාක්‍යාංශ සඳහා යෙදිය හැකි තනි පදය ලියන්න.

23. රටින් නෙරපීම

(1) පිටිවහල (2) පිටකිරීම (3) පිටුපෑම (4) පිටුවහල

24. නැවත නැවත අභ්‍යාස කිරීම සාර්ථක නිර්මාණකරුවෙකු බිහි කරයි.

(1) ප්‍රතිභාව (2) සතතාභ්‍යාසය (3) පරිකල්පනය (4) බහුශ්‍රැත

25. දී ඇති වචන ගොනු අතුරෙන් අන්‍යෝන්‍ය වශයෙන් සමීප කාර්යයන් සමග බැඳී නොපවත්නා පද පේළිය තෝරන්න.

(1) ගයනවා, නටනවා, වාදනය කරනවා, රඟපානවා
(2) ලියනවා, අඳිනවා, මකනවා, සෝදනවා
(3) වපුරනවා, නෙළනවා, සිටුවනවා, පොරු ගානවා
(4) ගරනවා, හැඳිගානවා, මිරිකනවා, පෙරනවා

❖ ප්‍රශ්න අංක 26, 30 යටතේ දී ඇති ප්‍රශ්නවල ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍ය තෝරන්න.

26. (1) මිනිස්සු හදවතට එකඟව කටයුතු නොකරන්නේ ඇයි?
(2) සිසුන් සිවු දෙනෙක් විභාගය උසස් ලෙස සමත් වූහ.
(3) පයින් ගමන් කරන්නන් පාරේ දකුණු දෙසින් යා යුත්තෝ ය.
(4) අලුත් අවුරුදු සමය ළං වන විට ඔවුහු තුමූ ගමට ගිය හ.

27. (1) පියාණෝ වෙහෙස වී දරුවන් පෝෂණය කරයි.
(2) බොහෝ දෙමව්පියෝ රැස්වීමට පැමිණ ඇත.
(3) සිසුන් විභාගය සමත් වෙති'යි ගුරුවරු අපේක්ෂා කරති.
(4) රජ තෙමෙ දඩ කෙළියට ගියෝ ය.

28.
- වෛද්‍යවරුන් ............................. ලෙඩ්ඩු රැකබලා ගැනෙති.
- අනේ ඔවුන් ............................. මගෙන් අසන්න එපා
- හොඳ ප්‍රතිඵල ලබාගනු ............................. දරුවන් අධිෂ්ඨාන කරගත යුතු ය.
- තාත්තා දක්ෂ ගායකයකු ............................. ගීත ගායනා කරයි.

ඉහත වාක්‍යවල හිස්තැන් පිරවීම සඳහා වඩාත් යෝග්‍ය නිපාත පද අනු පිළිවෙළින් යෙදී ඇති වරණය කුමක් ද?

(1) සේ, පිණිස, ගැන, විසින් (2) පිණිස, ගැන, විසින්, සේ
(3) විසින්, ගැන, සේ, පිණිස (4) විසින්, ගැන, පිණිස, සේ





Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

29. පහත වාක්‍ය ලේඛන ව්‍යවහාරයට හැර වූ විට වඩාත් නිවැරදි වරණය වන්නේ කුමක් ද?
    (1) අප පන්තියේ කෑකෝ ගැසුවාම ගුරුවරු අවවාද කළා.
    (2) අපි පන්තියේ කෑකෝ ගසද්දී ගුරුවරුන් අවවාද කළෝ ය.
    (3) අප පන්තියේ කෑකෝ ගසද්දී ගුරුවරු අවවාද කළ හ.
    (4) අප පන්තියේ කෑකෝ ගසද්දී ගුරුවරු අවවාද කළේ ය.

30. රූපකයක් සඳහා නිවැරදි උදාහරණයක් වන්නේ,
    (1) ඈ සුරංගනාවියක බඳු කාන්තාවකි. (2) ඔහු කඩියකු මෙන් දිව ගියේ ය.
    (3) ඒ පුද්ගලයා වීරත්වයෙන් සිංහයෙකි. (4) රථය පවනට බඳු වේගයෙන් දිව යයි.

31. "රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා" යන කවි පදයේ ඇතුළත් කාව්‍යාලංකාරය වන්නේ,
    (1) උපමා (2) රූපක (3) උත්ප්‍රේක්ෂා (4) අතිශයෝක්ති

32. පිලේ පැදුර හේනට අරගෙන එනවා
    එළා පැදුර මැස්සේ එහි සැතපෙනවා
    රටා වියපු අත් දෙක මට සිහිවෙනවා
    හිතේ දුකට එතකොට කවි කියවෙනවා

    ඉහත සඳහන් කවිය ඇතුළත් වන කෘතිය හා කවියා වන්නේ,
    (1) අකීකරු පුත්‍රයකුගේ ලෝකය - පරාක්‍රම කොඩිතුවක්කු
    (2) සක්වාලිහිණි - මහගමසේකර
    (3) ප්‍රබුද්ධ - මහගමසේකර
    (4) වස්සානය - රත්න ශ්‍රී විජේසිංහ

33. "කන්කටුවට කරදර තෙපලන්නේ" යන්නෙහි ගැළපෙන අදහස තෝරන්න.
    (1) අමිහිරි ලෙස කතා කරන්නී ය. (2) කනේ කටු අනිමින් කරදර කරන්නී ය.
    (3) කටුක ලෙස දුක් කරදර කරන්නී ය. (4) කනගාටුවට කරුණු කියන්නී ය.

34. ධීවර ගීතය නම් වූ පැදි පෙළ රචනා කරනු ලැබුවේ,
    (1) පී.බී. සේනානායක විසිනි. (2) ගුණදාස අමරසේකර විසිනි.
    (3) එච්.එම්. කුඩලිගමයන් විසිනි. (4) කේයස් විසිනි.

35. පිරුවානා පොත් වහන්සේ
    කනප්පුවේ පෙරළී ඇත
    මිදුල පුරා වියළුණු කොළ
    ඒ මේ අත විසිර තිබේ

    මේ පද්‍යයෙන් කියවෙන්නේ,
    (1) අවුල් වූ නිවසක් ගැන ය. (2) පාලුවට ගිය නිවසක් ගැන ය.
    (3) මියගිය උවසියක ගැන ය. (4) මිණී මැරුමක් ගැන ය.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

36. පහත සඳහන් කවි පදවල යොදා ගෙන ඇති මාත්‍රා පිළිබඳ ඇතුළත් නිවැරදි පිළිතුර තෝරන්න.

"සඳවා සුදුවැලි පිවිතුරු"

"ළඟ ළඟවා උනුනට කරවාදය"

"විදෙන ලෙළෙන තරු බර පුළුලුකුළ රැඳි"

"රූ රසේ අඳිනා ලෙසේ අත් ලෙළ දිදී විදුලිය පබා"

(1) මාත්‍රා 16, මාත්‍රා 12, මාත්‍රා 18, මාත්‍රා 26 (2) මාත්‍රා 12, මාත්‍රා 16, මාත්‍රා 18, මාත්‍රා 26

(3) මාත්‍රා 18, මාත්‍රා 12, මාත්‍රා 26, මාත්‍රා 16 (4) මාත්‍රා 26, මාත්‍රා 18, මාත්‍රා 12, මාත්‍රා 16

37. රිවිබිම්බා යුරු රිවිකුල කමලකර

පියුමම්බා නිතොරව රැඳි උරමැදුර

මෙනරම්බා හිමි රූ සිරිනි මනහර

පැරකුම්බා නරනිඳු සඳ දකු මිතුර

මෙහි වැඩිපුර ම යෙදී ඇති කාව්‍ය උපක්‍රමය වන්නේ,

(1) එළිසමය (2) අනුප්‍රාසය (3) රූපක (4) උපමා

38. සිකුරු ග්‍රහයාට ව්‍යවහාර වන නමකි,

(1) ඉරරාජ් (2) ඉරබටු තරුව (3) ඉරවඩ් (4) ඉරණමඩු

39. උඩරට භාෂාවේ "පුන්නනවා" යනු,

(1) ලෙලි ගසනවා යන අදහස දනවන්නකි. (2) රෝග වැළඳෙනවා යන අදහස දනවන්නකි.

(3) නළවනවා යන අදහස දනවන්නකි. (4) උත්සහ කරනවා යන අදහස දනවන්නකි.

40. පහත සඳහන් පාඨයේ අර්ථයට වඩාත් සමීප අදහස දෙන පිළිතුර තෝරන්න.

සමාජ සාරධර්ම, සිරිත් විරිත්, නීතිරීති ආදියට හානියක් නොවන පරිදි තම සිතැඟි අව්‍යාජ ලෙස හෙළිදරවු කළ ජන කවියා සෑම විටම තම නිර්මාණවලින් අදීන කවීත්වයක් පළ කර ඇත.

(1) ජන කවියා අදීන කවීත්වය තම නිර්මාණවලින් එළිදක්වා ඇත්තේ සමාජ සාරධර්ම, සිරිත් විරිත් හා නීතිරීති ආදියට හානියක් නොවන පරිදි ය.

(2) තම සිතැඟි අව්‍යාජ ලෙස ඉදිරිපත් කරමින් අදීන කවීත්වයක් තම නිර්මාණවලින් පළකර ඇති ජන කවියා සමාජ සාරධර්ම, සිරිත් විරිත් හා නීතිරීතිවලට හානියක් කර නැත.

(3) ජන කවියා අදීන කවීත්වයක් තම නිර්මාණවලින් පළකර ඇති අතර, සිරිත් විරිත් හා නීතිරීති ආදියට හානියක් නොවන පරිදි තම අදහස් අව්‍යාජ ලෙස ඉදිරිපත් කර ඇත.

(4) තම නිර්මාණවලින් අදීන කවීත්වයක් පළකර ඇති ජන කවියා සමාජ සාරධර්ම, සිරිත් විරිත් හා නීතිරීතිවලට හානියක් නොවන පරිදි තම සිතැඟි එළිදක්වා ඇත.

(ලකුණු 1 x 40 = 40)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hour

## Sinhala Langugage & Literature – II
## සිංහල භාෂාව හා සාහිත්‍යය – II

| 21 | S | II |
|---|---|---|

Name :- ................................................... Grade : -................ Index number:-....................

- ❖ **ප්‍රශ්න සියල්ලට ම උත්තර සපයන්න.**
- ❖ **මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන 80 කි.**

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසක් නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) සිංහල අක්ෂර මාලාවේ ඇතුළත් වර්ගාන්ත අක්ෂර දෙකක් ලියන්න.

(ii) පහත සඳහන් වාක්‍ය දෙකෙහි තදකළ අකුරෙන් දැක්වෙන පද අයත් ක්‍රියා වර්ගය නම් කරන්න.

(අ) ගුරුවරයා සිසුවා ලබා පාඩම් **කරවයි.**

(ආ) නැළවිලි ගීයක් **ගයන්න.**

(iii) පහත සඳහන් පද දෙකෙහි විරුද්ධාර්ථ පද ලියන්න.

(අ) සමීපස්ථ

(ආ) විරාගී

(iv) පහත සඳහන් ඡේද කොටසෙහි ඇති සදොස් වචන දෙක නිදොස් කොට ලියන්න.

විචාරකයා කාව්‍යයේ ඇති වාච්‍යර්ථය මෙන්ම ව්‍යංගාර්තය ද වටහා ගත යුතු ය.

(v) පහත සඳහන් වාක්‍ය සදොස් නම් නිදොස් කර ලියන්න.

(අ) නංගීත් නුඹත් මමත් අම්මා එනතුරු බලා සිටියා ය.

(ආ) ගොවියෝ නිපදවන දෙයින් අතරමැදියන් ලාභ ලබති.

(vi) (අ) බැලීම් යන ක්‍රියා පදයේ ධාතු මූලය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

(ආ) උදුල්ල යන නාම පදයේ ශබ්ද ප්‍රකෘතිය හා ප්‍රත්‍යය වෙන් කර දක්වන්න.

(vii) පහත සඳහන් වාක්‍යයෙහි ඇතුළත් නිපාත පද දෙක තෝරා ලියන්න.

සිංගප්පූරුවේ සිට පැමිණි එක්ස්ප්‍රස් නෞකාව ගිනිගැනීමෙන් පසු මුහුදු බත් විය.

(viii) නුවර කලාවියේ ජනවහරේ යෙදෙන පහත සඳහන් වචනවල අදහස ලියන්න.

(අ) නව නිංගිරාව

(ආ) නෙයියාඩගම්





agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(ix) පහත සඳහන් වචන දෙක යොදා අර්ථය පැහැදිලි වන සේ ව්‍යාකරණානුකූල ව නිවැරදි වාක්‍ය දෙකක් ලියන්න.

(අ) ප්‍රසාදය

(ආ) ප්‍රාසාදය

(x) (අ) ප්‍රථම පුරුෂ සර්වනාම පදයක් ඇතුළත් වාක්‍යයක් ලියන්න.

(ආ) දූරිය යන උක්ත පදයෙහි අනියමාර්ථ අනුක්ත පදය ලියන්න.

(ලකුණු 2 x 10 = 20)

(2) පහත දක්වෙන (අ) (ආ) (ඉ) (ඊ) යන විස්තර අතුරෙන් එකක් තෝරාගෙන වචන 250 කට නො අඩු වන සේ රචනයක් ලියන්න.

(අ) ආහාර නිෂ්පාදනයට ලබා දෙන දිරිගැන්වීම ඒවා සංරක්ෂණය කර ගැනීම සඳහා ද යොමු කිරීම අත්‍යවශ්‍ය කරුණක් වී ඇත. නිෂ්පාදිත එළවලු හා කෙසෙල් ගස්ලබු ආදී අස්වැන්න සැලකිය යුතු මිලකට විකුණා ගැනීමට නොහැකි වී නුවරඑළිය, වැලිමඩ, සූරියවැව, ඇඹිලිපිටිය ආදී ප්‍රදේශවල ගොවීන් පසුගිය සංචරන සීමා කාලයේ දී අසරණභාවයට පත් වී ඇති අයුරු අසන්නට දකින්නට ලැබුණි. මෙයට හේතුව පෞද්ගලික වෙළෙන්ඳන්ගේ බලපෑමයි. මෙසේ පෞද්ගලික අංශයේ වෙළෙන්ඳන්ගේත් සූරාකෑමට ලක්වන ගොවියා ආරක්ෂා කර ගැනීම රජයේ වගකීමකි.

(ආ) නිවාස හා ව්‍යාපාරික අවශ්‍යතා සඳහා ගොඩනැගිලි ඉදිකිරීම ශීඝ්‍රයෙන් ඉහළ යෑම නූතනයේ මෙරට දැකිය හැකි ප්‍රවණතාවකි. මෙහි ප්‍රතිඵලය වන්නේ මිනිසාගේත් සත්ව සංහතියේත් පැවැත්ම කෙරෙහි දැඩි බලපෑමයි. එසේ වීමට හේතුව පාරිසරික වෙනස්වීම් ගණනාවක් ජනිත වීය හැකි මේවා අවමකර ගැනීමට කඩිනම් පියවර ගැනීම අවශ්‍ය ය.

(ඉ) වර්තමාන ඇතැම් ජනමාධ්‍ය අසත්‍ය ප්‍රකාශ, වර්ගවාදී අදහස්, ආගමික සහජීවනය බිඳවැටෙන වාර්තා, පක්ෂග්‍රාහීව කටයුතු කිරීම වැනි මාධ්‍ය සදාචාරයට පටහැනි ලෙස ක්‍රියාකිරීම නිසා ඒවා කෙරෙහි ජනතා විශ්වාසය බිඳවැටේ. ජනමාධ්‍යයක වගකීම වන්නේ මධ්‍යස්ථ මතයක සිට සත්‍ය තොරතුරු ගම්දනව් පුරා ජනතාව වෙත වාර්තා කිරීම යි.

(ඊ) ජනයා බහුල ව ගැවසෙන හතරමං හන්දියක පාර අයිනේ පිහිටි විශාල වෘක්ෂයකි. එහි අතුපතර සියල්ලක් ම පාහේ කපා දමා ඇත. එයින් ඉතිරි වී ඇති අත්තක් අගින් විටින් විට දිය බිඳු කඩා හැලේ. මඟ යන්නෝ දුක්බර ඇසින් ගස දෙස බලා සිටිති. ගිනියම් අව්වේ කයෝර බව ගැන කතා කරති. ගස කඳුළු සලමින් ලෝකයාට දුක කියනවා විය හැකි ය. මේ කරුණු කෙරෙහි අවධානය යොමුකොට නිර්මාණාත්මක රචනයක් ලියන්න.

(ලකුණු 25)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!





agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(3) පහත දැක්වෙන පාඨය වචන 65-75 වතර වන සේ සාරාංශ කොට ලියන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව සාරාංශය අග ලියන්න.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මය වුවත් අපේ පාසල්වල කෘෂිකර්මය ඉගැන්වීමට සැලකිල්ලක් නොදක්වති. මීට දසක පහකට පමණ පෙර මේ සඳහා අත්හදා බැලීම් ප්‍රයත්නයක් දැරිය. තෝරාගත් පාසල් කිහිපයකට 6, 7 සහ 8 යන ශ්‍රේණිවලට විද්‍යාත්මකව කෘෂිකර්මය ඉගැන්වීමට සැලැස්මක් සම්පාදනය කෙරුණේ ය. මේ සඳහා විදේශීය විශේෂඥ උපදෙස් ලබා ගැනිණි. ජල පහසුව ඇති කුඩා අත්හදා බැලීමේ භූමි භාගයක අවශ්‍ය පහසුකම් හා උපකරණ සහිත කෘෂිකර්ම විද්‍යාත්මක විද්‍යාගාරයක් ප්‍රමිත කෙරුණු විශේෂ අංශයක් සැලසුම් කෙරිණි.

මේ විෂයය ඉගැන්වීමට ද්විතීයික පුහුණු තත්ත්වයේ විශේෂඥ ගුරුවරුන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අනුග්‍රහයෙන් පුහුණු කෙරුණු අතර, කෘෂිකර්මය පිළිබඳ විශේෂඥ පරීක්ෂක තනතුරක් ද ඇති කෙරිණි. පාඨමාලා සහ නිර්දේශ පත්‍ර සහිත විස්තරාත්මක ඉගැන්වීමේ පටිපාටි සහ ගුරු අත්පොත් සූදානම් කරන ලදි. තවද මේ විශේෂඥ ගුරුවරුන්ට විධිමත් උපදෙස් දෙනු ලැබීය. බීජ පොහොර ආදිය මිලට ගැනීම සඳහා මුදල් වෙන් කරන ලදි. 9 සහ 10 පන්තිවලට ද මේ වැඩපිළිවෙළ දීර්ඝ කරන ලදුව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා ද පසුව උසස් පෙළ සඳහා ද කෘෂිකර්ම විද්‍යාව විෂයයක් ලෙස පිළිගැනිණි. මේ සියලු උත්සාහයන් මධ්‍යයේ වුව ද කෘෂිකර්ම විද්‍යා අංශ ඇති පාසල් සුළු ප්‍රමාණයේ ශිෂ්‍යයන් අතර පවා කෘෂිකර්මය ජනප්‍රිය විෂයයක් වී යයි කීම අපහසු ය. අපේ අධ්‍යාපනයේ ප්‍රධාන ගැටලුවක් වන මෙය විසඳිය හැකි වුවත් තවම විසඳී නොමැත.

(ලකුණු 10)

(4) පහත සඳහන් පද්‍ය කොටස කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

දිවා රැයේ ඉරයි හඳයි සොහොන් බිමත් සිඟී
පුතාගේ රූපයෙන් බිඳක් අරන් කුසුම් පිපේ
විහංගයෝ මගේ හැඟුම් සරල් හඬින් කියත්
ලොවේ සියල්ලෝමත් මගේ පුතාට ආදරයි

වනේ කුසුම් පිපී නැසේ මිලා වී වැටේ
සුගන්ධයක් වනේ මිසක් පිටස්තරින් නොවේ
අහිංසකත්වයෙන් පිරී මගේ කුඩා පුතා
එසේ මැරී ගියා ලෙවන්හටත් නොදන්නවා

ගඟක් ගලා ගියාලු වාලුකා තලේ වැදී
කුඩා ගෙඩිත් වැටේ අකල් නැසීමකින් ලොවේ
සොබාදමේ ගිමන් කලේ ළපල්ලයක් වෙලා
පුතා ද එක් වුණා අහෝ නොඑන්නවුන් සහා





agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

(1) මෙයින් කියවෙන්නේ කුමන සිද්ධියක් ගැන ද?

(2) ''මගේ හිතේ ඇති දුක'' යන ප්‍රකාශය කරන්නේ කවුද?

(3) අකල් මරණය උපමා කර ඇත්තේ කුමකට ද?

(4) ලෝකයාට නොදන්වා මෙලොව අතහැරගියා යන අදහස ඇති පද පේළිය ලියන්න.

(5) මල් ලස්සනට පිපෙන්නේ ඇයි?

(ලකුණු 2 x 5 = 10)

(5) දීර්ඝ කාලයක් තිසේසේ උග්‍ර පානීය ජල හිඟයකින් පෙළුණු ඌවපරණගම ප්‍රදේශයට නළ ජල ව්‍යාපෘතියක අවශ්‍යතාව පවතී. ප්‍රාදේශීය සංවර්ධන සමිතියේ ලේකම් ආසිරි කහත්තේවෙල ඔබ යයි සිතා මෙම ජල යෝජනා ක්‍රමයේ අවශ්‍යතාව පැහැදිලි කරමින් ප්‍රාදේශීය සභාවේ සභාපතිට ඉදිරිපත් කිරීම සඳහා සුදුසු ලිපියක් සකස් කරන්න.

***(මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය.)***

**නැතහොත්**

රාජකීය විද්‍යාලයීය ශිෂ්‍ය නායක කමිටුව සංවිධානය කරන අක්ෂි වෛද්‍ය සායනයක් 2021 ජුනි 20 දින පෙ.ව. 9.00 සිට ප.ව. 2.00 දක්වා කිතුල්කොටුව ප්‍රජාශාලාවේ දී පැවැත්වීමට තීරණය කර ඇත. මෙදින පාසලෙන් බිහිවූ අක්ෂි වෛද්‍ය විශේෂඥයෝ කීපදෙනෙකු සහභාගී වෙති. ආර්ථික දුෂ්කරතා ඇති අය වෙනුවෙන් උපැස් යුවළ නොමිලේ ලබා දීමට ද තීරණය කර ඇත. මේ පිළිබඳව ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම සඳහා සුදුසු දැන්වීම් පත්‍රිකාවක් පිළියෙළ කරන්න.

***(මේ සඳහා වචන 100 ක් පමණ ප්‍රමාණවත් ය.)***

(ලකුණු 15)



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time : 2 hour**

## Sinhala Langugage & Literature – III

සිංහල භාෂාව හා සාහිත්‍යය – III

| 21 | S | III |
|---|---|---|

Name :- ..................................................... Grade : -................ Index number:-....................

වැදගත් : උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට පමණක්** උත්තර සපයන්න.

1, 2, 3, 4 ප්‍රශ්නවලටත් 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.

මෙම ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණු ගණන 80 කි.

(1) (i) සිට (x) තෙක් ඇති සියලු ම අනුකොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසක් නොලියන්නේ නම් එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.

(i) ඉතිකින් අපගේ දිවි නැති, බ්‍රහ්මදත්තයා තෙමේ දූන් දූන් අප හැම මරන්නේ ය.

(අ) මෙම පාඨය ඇතුළත් ග්‍රන්ථයේ නම ලියන්න.

(ආ) මෙසේ කියන්නේ කවරෙක් ද?

(ii) ගොඩැල්ලේ තරම දැනගෙන ළිඳ කපනු
බොරැල්ලේ තරම දැනගෙන උඩ පනිනු
..........................................................................
තමන්ගේ තරම දැනගෙන කල් හරිනු

(අ) මෙම කවියේ තෙවැනි පද පේළිය සම්පූර්ණ කරන්න.

(ආ) ඉහත පද්‍යයට වඩාත් ගැළපෙන ආප්තෝපදේශය ලියන්න.

(iii) ''මේ ගම දූන් හොල්මන් අඩිකෝඩ පිරුණු යකුන් අරක්ගත් කාලකණ්ණි ගමකි.''

(අ) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද?

(ආ) මේ කියැවෙන ගමේ නම කුමක් ද?

(iv) වේ රුදු දෝසා කළ මේ දේ
මා පුතු නොතකා විපාකේ

(අ) මෙහි ''මා පුතු'' යනුවෙන් අමතන්නේ කාට ද?

(ආ) මේ පාඨය ඇතුළත් නිර්මාණයට පාදක වූ මුල් කෘතිය කුමක් ද?

(v) පහත සඳහන් ග්‍රන්ථ රචනා වූ යුග නම් කරන්න.

(අ) කාව්‍යශේඛරය

(ආ) බුදුගුණ අලංකාරය

(vi) බත් පාත්‍රයක් පිළිගන්වා ගන්ට පාත්‍රය ගෙනව මැනව

(අ) මේ කොටස ඇතුළත් ග්‍රන්ථයේ කතුවරයා කවුද?

(ආ) මේ කොටස ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?



agaram.lk

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(vii) පවන ද පිපි තුරේය නිර තුරේ ය
කුසුමන් පෙති තුරේ ය මළු තුරේ ය
අවට සුපිපි සරේ ය බිඟු සරේ ය
..............................................................................

(අ) සිව්වන පේළිය සම්පූර්ණ කරන්න.
(ආ) 'සරේය' යන පදයේ අර්ථ දෙකකි. එම අර්ථ දෙක ම ලියන්න.
(ලකුණු ලැබෙන්නේ වචන දෙක ම ඇත්නම් පමණකි.)

(viii) (අ) ගංගාවේ සංගීතය කවි පන්තියේ රචකයා කවුද?
(ආ) ඔහුගේ අන්වර්ථ නාමය කුමක් ද?

(ix) කඳු බැවුමක දං බෝවිටි පඳුරු තලා
පහළට ඇදී පර මල් පෙති ඉවත නොලා
කලදෝ දියෙන් පොගවා රන් පුලින තලා
සංගීතවත් වී යමි ඉදිරියට ගලා

(අ) කලදෝ දියෙන්
(ආ) පුලින තලා
යන පදවල අර්ථය ලියන්න.

(x) ටිබෙට් ජාතික එස්. මහින්ද හිමි තම නිර්මාණ තේමා තුනක් යටතේ ඉදිරිපත් කළ අතර, එයින් තේමා දෙකක් ලියා දක්වන්න.

(ලකුණු 2 x 10 = 20)

(2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

(i) ඔබ පියාණෝ නරයෙකු නොව වනයේ දී මට හමු වූ සිංහරාජයෙකි. ඔහු කෙරෙහි ඇති වූ ප්‍රේමය නිසා මම රජ සැප හැර දමා මේ වනයෙහි වෙසෙමි.

(අ) මේ ප්‍රකාශය කරන්නේ කවුද?
(ආ) මේ ප්‍රකාශය කරන්නේ කාට ද?

(ii) ගං ඉවුරෙහි අලි ඇට තරි අදිනවා කියලා අලි ගඟේ නාන්නේ නැතිව අරිනවා ද?

(අ) මේ ප්‍රකාශය හා සම්බන්ධ අවස්ථාව කුමක් ද?
(ආ) ඊට සම්බන්ධ වූවෝ කවරහු ද?

(iii) නිබඳ පැසී පල **<u>ලඹ දෙන</u>** මිහිර'ඹය
සුවඳ විහිද සිටි **<u>විලිකුන්</u>** කැන් රඹය
නොමද තැනින් තැන වලු බර වනරඹය
එමැද වෙහෙර දිලි දුරලන සසරඹය

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත කවියේ යෙදී ඇති ශබ්දාලංකාර දෙකක් ලියන්න.

(iv) තතු මතු ද සින්දේ
**<u>පිළිමල්</u>** දපද සින්දේ
**<u>යස</u>** දිගත ඇන්දේ
විජය සිරි සඳගෙන වැලැන්දේ

(අ) ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) කවියේ අර්ථය ලියන්න.



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(v) සොර ක්ලාන්ත වියැ **මියෙහි** කෙළ සිඳී ගියේ
ශරීරයෙන් **ස්වේද** බස්සී

(අ) මියෙහි, ස්වේද යන වචනවල තේරුම ලියන්න.

(ආ) ඉහත පාඨය හා සම්බන්ධ අවස්ථාව ලියන්න.

(ලකුණු 4 x 5 = 20)

(3) කැරගල ගම්පියසෙහි වර්ණනාවට ලක් වූ ආකාරය වීදාගම හිමියන් යොදාගත්

(i) වස්තු විෂයත්

(ii) ස්වභාව සෞන්දර්යයත් මැනවින් නිරූපනය වේ. නිර්දිෂ්ඨ කොටස ඇසුරෙන් විමසන්න.

**නැතහොත්**

(අ) අවස්ථාවෝචිත විරිත් හා

(ආ) රස භාව පූර්ණ වදන් භාවිතයත් නිසා ගුත්තිල කවියාගේ උසස් නිර්මාණ ශක්තිය ප්‍රකට කරයි. උදාහරණ දෙමින් විග්‍රහ කරන්න.

(ලකුණු 15)

(4) (i) තාරුණ්‍යයට එළැඹි ගැටවරයකුගේ සිතුම් පැතුම් හා ක්‍රියා කලාපය පිළිබඳවත්,

(ii) දියණියක සතු පිතෘත්වයත් සිංහබාහු නාට්‍යයෙන් නිරූපණය වේ. උදාහරණ දෙමින් පැහැදිලි කරන්න.

**නැතහොත්**

(i) ගුරුළුගෝමි පඬිවරයා අමාවතුර රචනා කිරීමේ දී

(i) අවස්ථා නිරූපණය

(ii) සිද්ධි නිරූපණය සජීවී අයුරින් පාඨකයාට ඉදිරිපත් කිරීමට සමත් වී ඇත. උදාහරණ දෙමින් සනාථ කරන්න.

(ලකුණු 15)

**5, 6, 7 ප්‍රශ්නවලින් එක් ප්‍රශ්නයකට පිළිතුරු සපයන්න.**

(5) බැද්දේගම නවකතාවේ පුංචි මැණිකාගේ චරිතය පාඨක හදවත් සානුකම්පිත අයුරින් පුරවාලයි. උදාහරණ සහිතව මේ කියමන විමසන්න.

(6) දේශාභිමානී හැඟීම් ළමා සිත් පුබුදුවාලීමට හේතුවේ. ඒ සඳහා භාෂාව ප්‍රමුඛස්ථානයක් ගනී. කවියා සතු දක්ෂතාව ජාතික තොටිල්ල පැදි පෙළ ඇසුරින් මනාව ඉස්මතු වේ.
උදාහරණ තුනක්වත් දෙමින් විමසන්න.

(7) උම්මග්ග ජාතක කතාවෙන් වර්ණනා කෙරෙන මහෞෂධ පඬිතුමාගේ ස්ථානෝචිත ප්‍රඥාවත් කේවට්ට බමුණා තම බුද්ධිය විනාශයටත් යොදාගත් ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)





agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!